# ශ්‍රී ලංකාවේ මායිම් ගම්මාන ප්‍රදේශයක ජනවාර්ගික සම්බන්ධතා පිළිබඳ අධ්‍යනයක්: ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සේරුවිල වසම ඇසුරින් සිදුකළ ප්‍රත්‍යෙක අධ්‍යයනයකි.

# A Study of Ethnic Relations in a Border Village Area of Sri Lanka: A Case Study of Seruvila Division in the Trincomalee District.

ඊ. එම්. සමන්ත ඒකනායක
HD/Mphil/01/02/881

මෙම ස්වාධීන නිබන්ධය ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ

දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන්නකි.

2010



648573

# සාරාංශය

1950 ගණන්වල සිට ජනවාර්ගිකත්වය යන සංකල්පය සමාජ පර්යේෂකයන්ගේ දැඩි අවධානයට යොමු විය. සාපේක්ෂ වශයෙන් මෙය අලුත් සංකල්පයක් වන අතර ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයට මෙම වචනය එක්වූයේ 1972 වර්ෂයේය. අනතුරුව 1973 වසරෙහි ඇමරිකානු උරුම ශබ්දකෝෂයෙන් මේ සම්බන්ධයෙන් පුළුල් නිර්වචනයක් ඉදිරිපත් කරන ලදි. සංස්කෘතික සාධක පදනම්කොටගෙන මිනිසුන් සමූහගතවීම මින් අදහස් කෙරේ. අනෙක් බොහෝ සමාජීය විද්‍යා සංකල්ප මෙන්ම ජනවාර්ගිකත්වය සංකල්පය සම්බන්ධයෙන් සැලකීමේදී විවිධ වූ අර්ථකථනයන් ඉදිරිපත් වී තිබේ. ඒ බැව් ඇමරිකානු සංක්‍රමික ජනතාව සම්බන්ධයෙන් සිදුකරන ලද පර්යේෂණ තුළින් විද්‍යමාන වේ. ජනවාර්ගිත්වය සම්බන්ධයෙන් අධ්‍යයන පළමුව ඇමරිකාවට සංක්‍රමණය වූ ජනයා සම්බන්ධයෙන් ආරම්භ කළ ද 20 වන ශත වර්ෂය අවසන් වන විට ලෝකයේ සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවලට ව්‍යාප්ත වී තිබේ. එබැවින් ජනවාර්ගිකත්වය, ජනවාර්ගික අනන්‍යතාවය සහ ජනවාර්ගික සම්බන්ධතා වැනි දෑ සමාජවිද්‍යා විෂය තුළ ප්‍රධාන මාතෘකා බවට පත්ව තිබේ.

මායිම් ගම්මාන ප්‍රදේශයක පසුගිය දශක හය තුළ ජනවාර්ගික සම්බන්ධතා විකාශන ක්‍රියාවලිය තේරුම් ගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. එයට අමතරව ජනවාර්ගික සම්බන්ධතා බිඳවැටී යුද්ධයක් දක්වා වර්ධනය වීමේ ක්‍රියාවලියට බලපෑ ආභ්‍යන්තරික සහ බාහිර සාධක තේරුම් ගැනීම, ජනවාර්ගික පුනර්ජීවනය සහ ජනවාර්ගික ගැටුම් අතර සම්බන්ධය තේරුම් ගැනීම සහ ජනවාර්ගික විකාශන ක්‍රියාවලිය කෙරෙහි ප්‍රදේශයේ ආගමික නායකයෙකුගේ ක්‍රියාකාරිත්වය තේරුම් ගැනීම මෙහි අනු අරමුණු විය.

එබැවින් යථෝක්ත අරමුණු නිරීක්ෂණයට මූලාකෘත, ආවස්ථික සහ තරඟකාරී ආදර්ශය නම් එළඹුම් ජනවාර්ගික සම්බන්ධතා තේරුම් ගැනීමට විකල්ප ප්‍රවේශ ලෙසින් යොදා ගැනුණි.

මෙම අධ්‍යයනය ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, සේරුවිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආශ්‍රයෙන් සිදුකරන ලදි. සේරුවිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනවර්ග නියෝජනය කරමින් ගම්මාන තෝරා ගැනිණ. ද්විතීක දත්තවලට අමතරව සම්මුඛ සාකච්ඡා, ප්‍රත්‍යක්ෂ අධ්‍යයන, කණ්ඩායම් සාකච්ඡා, සහභාගිත්ව නිරීක්ෂණය සහ නියැදි සමීක්ෂණය යොදා ගනිමින් මූලික දත්ත රැස්කෙරිණ.

1952 අල්ලායි (සේරුවිල) ගොවිජනපදය පිහිටුවීමෙන් අනතුරුව ක්‍රමිකව වාර්ගික සමූහ අතර විවිධ අංශ තුළින් ජනවාර්ගික වශයෙන් අනුකලනය වූ සමාජයක් (Ethnically Integrated Society) බිහිවිය. එහෙත් පසුකාලීනව මෙම අනුකලනමය සමාජය බිඳවැටී 1983 යුද්ධය ඇරඹීමත් සමඟ අන්තර් වාර්ගික සමාජ පරිසරය පූර්ණ ලෙස බිඳවැටිණ. වාර්ගික වශයෙන් මිශ්‍ර ගම්මාන වෙනුවට සම වාර්ගික ගම්මාන ගොඩනැගීම, ජනවාර්ගික අන්තර් සබඳතා බිඳවැටීම, වැඩිහිටියන්ට සාපේක්ෂකව තරුණ පරම්පරාවට දෙවන බසක් කතාකිරීමට නොහැකිවීම, ජනවාර්ගික සුහදත්වයට සහ ජනවාර්ගික අනුකලනයට දායක වූ සංස්කෘතික පිළිවෙත් බිඳ වැටීම, අන්තර්වාර්ගික විවාහ අඩුවීම, අන්තර්වාර්ගික සැකය-අවිශ්වාසය වර්ධනයවීම, සහ අන්තර්වාර්ගික ආර්ථික රටා ව්‍යුහය බිඳ වැටීම යනාදිය ජනවාර්ගික දුරස්වීම්වලට උදාහරණ වශයෙන් දැක්විය හැකිය.

බාහිර දේශපාලනික ක්‍රියාකාරකම් හේතුවෙන් මෙම ප්‍රජාවන් තුළ ජනවාර්ගික තරඟකාරිත්වය (Ethnic Competition) සහ ජනවාර්ගික ගැටුම් (Ethnic Conflicts) නිර්මාණය විය. ජනවාර්ගික ව්‍යවසායකයින් ජනවාර්ගික අනන්‍යතාව (Ethnic Identity) තහවුරු කිරීමට සහ ජනවාර්ගික පුනර්ජීවනය (Ethnic resurgence) ඇති කිරීමට මැදිහත්වීම හේතුවෙන් මායිම් ගම්මාන තුළ 1980 පෙර ද ජනවාර්ගික ගැටුම් ඇතිවිය. ඉඩම් අයිතිය, ආගමික ස්ථානවල අයිතිය, ගොවිජනපද ඇති කිරීම, පරිපාලන නිළධාරීන් පත්කිරීම, ඡන්ද කොට්ඨාස කැඩීම, සංස්කෘතික විවිධත්වය, වාර්ගික සංයුතිය වෙනස්කිරීම් ආදී තත්වයන් ඔවුන්ගේ වාර්ගික තරඟකාරිත්වයට සහ ගැටුමට හේතු වූ සාධක විය. එබැවින් මායිම් ගම්මානවල ජනවාර්ගික ගැටුම් නිර්මාණය වන්නේ පොදු දේශපාලනික අවශ්‍යතා මත ඇතිකරන ලද බාහිර බලපෑම් නිසා යැයි මෙම ආනුභවික අධ්‍යයන සොයාගැනීම්වලට අනුව නිගමනය කෙරිණ.

එපමණක් නොව වාර්ගික සම්බන්ධතා බිඳවැටීම හේතුවෙන් සමාජ ප්‍රාග්ධනයෙහි (Social Capital) පැහැදිලි වෙනස්වීමක් සිදුවිය. එනම් යුද්ධයට පෙර ආබද්ධක ප්‍රාග්ධනය (Bonding Capital) මෙන්ම සම්බන්ධක ප්‍රාග්ධනය (Bridging Capital) වර්ධනය වී පැවතුණි. එහෙත් යුද්ධයෙන් පසු සම්බන්ධක ප්‍රාග්ධනය බිඳවැටී ආබද්ධක ප්‍රාග්ධනය පමණක් තහවුරු විය. වර්ෂ 2009 මැයි වන විට යුද්ධය නිමා වී ඇති නමුත් සම්බන්ධක ප්‍රාග්ධනය නැවත තහවුරු කිරීම ප්‍රධාන සමාජ දේශපාලන අභියෝගයක් බවට පත්ව තිබේ.